ආයතනයේ නම :- වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்:- நீர்ப்பாசனத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கனக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the institution :- Irrigation Department

Submission of observation of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of standing Order No .119(4)

ආකෘතිය 01

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්ය සාධනය පිළිබඳ ඇගයීම සඳහා සකස් කර ඇති මාර්ගගත පරිගණක කළමනාකරණ පද්ධතිය වෙත තොරතුරු කැඳවීම - 2022 මුදල් වර්ෂය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පළමු කොටස

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතාව	නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය හා වර්තමාන තත්වය
1	2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8. 1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	CIGAS ගිණුම් පද්ධතිය යටතේ පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර සෑම මසකම මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීම් හා අපහරණයන් කිරීම් මගින් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
2	මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගනුදෙනුවක්ම අවම තරමින් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගනුදෙනුවක්ම අවම නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා ඇත.
3	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි	මේ දක්වා ලැබී ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත.
4	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	කඩිනමින් පිළිතුරු ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී
5	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අංක 1/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් මු.රෙ. 756(6) අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය වන ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම සහ ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයේ අදාල අංශ, සියළුම කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල සහ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාල වලින් ගෙන්වා ගැනීම සඳහා අංක FIN/ST/VR/2023 හා 2024.05.10 දිනැති ලිපිය මගින් කටයුතු කර ඇති අතර එම තොරතුරු යොදාගෙන අඩුපාඩු නිවැරදි කිරීමට සැලසුම් කර ඇත.
6	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	වාරිමාර්ග දෙපාර්තමේන්තුව පරිහරණය කරනු ලැබූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිතිය ඇති වාහන 90%ක පමණ ලියාපදිංචි සහතික දෙපාර්තමේන්තුව භාරයේ ඇත. ඉතිරි වාහන සඳහා උධෘත ලබාගෙන එම වාහන වල අයිතිය තහවුරු කරගෙන ඇත.

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතාව	නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය හා වර්තමාන තත්වය
7	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ දෛනික ධාවන සටහන් පත් හා මාසික පිරිවැය වාර්තා රජයේ විගණන අංශය වෙත යොමු කොට ඇති අතර 2022 වර්ෂයේ, රජයේ විගණන අංශය සමඟ සාකච්ඡා කොට එම දෛනික ධාවන සටහන් පත් හා මාසික පිරිවැය වාර්තා ගෙන්වා ගැනීම තවදුරටත් ක්‍රමවත් කිරීමට කටයුතු කර ඇත.
8	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කර ඇත.
9	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2022 වර්ෂයේ ටෙන්ඩර් මඟින් ගර්හිත වාහන අපහරණය සඳහා කටයුතු සිදු කර ඇත.
10	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාහන සඳහා ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
11	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
12	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	හිඟ ණය ශේෂ වසරක් තුල අය කරගැනීම සම්බන්ධව විශාල පරිශ්‍රමයක් දරා ඇතත් වසරකට වඩා වැඩි ණය ශේෂ පැවැති බව නිරීක්ෂණය කරමි. එම ණය ශේෂයන්ද ඇපකරුවන්ගෙන් අයකර ගැනීම, විශ්‍රාම ගොස් ඇති අවස්ථාවල විශ්‍රාම පාරිතෝෂිකවලින් අයකර ගැනීම, මියගිය සේවකයින්ගේ නිරවුල් නොවූ ණය ශේෂ, මරණ පාරිතෝෂිකවලින් අයකර ගැනීම, වයස අවුරුදු 45ට වැඩි පත්වීම්ලාභින්හට ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි පවතින හිඟ ණය ශේෂ අයකර ගැනීම, ආයතන අංශය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියා කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඇතැම් අවස්ථාවල හිඟ ණය අයකර ගැනීම සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, තවද 2022 වර්ෂයේ පැවති ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධ 2024.06.30 දිනට ප්‍රගතිය ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරමි.
13	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම තැන්පතු මුදල් ලෙස නිලධාරීන්ට නිල නිවාස භාරදීමේදී අයකරනු ලබන තැන්පතු මුදල් සහ ව්‍යාපෘති වලට අදාළ රැඳවුම් මුදල වන අතර එම මුදල් ව්‍යාපෘති අවසන් වූ පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. **(ඇමුණුම - 02)**
14	රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	රැස්කරන ආදායම් කඩිනමින් රජයේ ආදායම් ගිණුමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දෙමි.

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතාව	නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය හා වර්තමාන තත්වය
15	රැස්කළ ආදායම් අදාළ විධි විධාන වලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි.	රැස්කරන ආදායම් රජයේ ආදායම් ගිණුමට හෝ ආදායම් ශීර්ෂයකට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
16	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි	2021 වර්ෂයේ දී " රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීම 2020" යටතේ බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත. එබැවින් සංවර්ධන නිලධාරී තනතුරේ අනුමත සීමාව ඉක්මවා ඇති අතර එම තනතුරු දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සඳහා අංක GA/3/6/Carder/2022 දිනැතිව ලිපියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තවද මේ සම්බන්ධව 2022.09.20 හා මේ සම්බන්ධව අංක GA/3/6 Carder හා 2024.02.07 හා 2024.05.14 දිනැතිව ද ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇත. ඒ අනුව රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020 යටතේ මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහා කළමනා කරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1217/V-Vi හා 2024.07.26 දිනැති ලිපියෙන් මු.රෙ. 71 ආකෘති පත්‍රය හා සාධාරණීය කරන වාර්තාව එවන ලෙස දන්වා ඇත. ඒ අනුව අදාල කටයුතු සිදු කරමින් පවතී.
17	කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සහ සේවකයන් සඳහා රැකියා විස්තර ලබා දීම සම්බන්ධව විධිවිධාන ඇතුළත් කරමින් 2023/02/28 දිනැතිව අංක 03/2023 දරණ වාරිමාර්ග චක්‍රලේඛය නිකුත් කර ඇත. (පාලන උප දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්, සේවකයින් සඳහා රැකියා විස්තර ලබා දීමට කටයුතු කර ඇත.)

දෙවන කොටස

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතාව	නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය හා වර්තමාන තත්වය
1	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අපගේ වෙබ් අඩවියේ මුල් පිටුව (Home page) විමසීම් / Contact us වෙත ගොස්) එහිදී විමසීම් විස්තර / inquire ගොනුව විවෘත කර අවශ්‍ය කරුණු ඇතුලත් කිරීමට කටයුතු සලසා ඇත. එහි ආකෘතියක් අමුණා ඇත. **(ඇමුණුම 03)**
2	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	කමිටුවක් පත් කර එමගින් එක් එක් අංශය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර තවදුරටත් අවශ්‍ය කටයුතු සඳහා ඒ ඒ අංශවලට යොමුකර ඇත. පාලන උප දෙපාර්තමේන්තුවේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර දැනටමත් ක්‍රියාත්මක කර ඇත.
3	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි .	ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා කමිටුවක් මගින් කටයුතු සිදු කර ගෙන යමින් පවතී. පාලන අංශයේ, පාලන 02, 03, 04 හා 05 පරිපාලන නිලධාරින් දැනටමත් පත් කර ඇත.
4	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	පුහුණු සැලැස්මෙහි කාර්ය මණ්ඩල වර්ගීකරණය අනුව සියලුම කාණ්ඩ ඇතුලත් වන පරිදි පුහුණු සැලසුම් ඉදිරිපත් කර ඇත.
5	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 (1) මගින් කාර්ය සාධන ගිවිසුම් ලබා දීම අවශ්‍ය නොවන බවට උපදෙස් ලබා දී ඇත.
6	සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මෙම වර්ෂය තුල දේශීය පුහුණු සඳහා ප්‍රතිපාදන කාර්තුමය වශයෙන් ලැබී ඇති අතර හදිසියේ සිදු වූ දෙපාර්තමේන්තු බඳවා ගැනීම් සඳහා ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රමාණයක් වැය වී ඇති අතර තවද වර්ෂය තුල අනිවාර්ය පැවැත්විය යුතු විභාග සඳහාද ලැබුණු ප්‍රතිපාදන ලබා දීමට සිදුවීම පුහුණු අවස්ථා සීමා වීමට හේතු වී ඇත. ඉදිරියේදී අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ලබා ගනිමින් සැලසුම්ගත පුහුණු අවස්ථා ලබාදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
7	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	විගණන මතය පිළිබඳ කොටස් 02 ක් ඇතුලත් කර ඇති බැවින් පැහැදිලි නැත. 2022 වර්ෂයේ විගණකාධිපතිගේ මූල්‍ය ප්‍රකාශනයේ මතය පිළිබඳ කොටස ඇමුණුම **04** ලෙස ඉදිරිපත් කරමි.
8	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. .	බොහෝ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත. ඉතිරි නිර්දේශ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

9	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	බොහෝ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත. ඉතිරි නිර්දේශ ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
10	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	බොහෝ නිළධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇති අතර අනෙක් නිලධාරින්ට වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම සම්බන්ධයෙන් නියෝග කර ඇත.

කේ. ඩී. ලාල්කාන්ත (පා.ම)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය
අංක : 500,
ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

2025.09.01

2022.12.31 දිනට රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ රජයට අයවීමට ඇති හිඟ හිටි ණය ශේෂයන්ගේ 2024.05.31 දිනට ප්‍රගතිය

Categories	2022/12/31 Balance							Recover		2024/05/31 Balance		
	No of Employees	Total Loan Balance to be received as at 2022.12.31	Age analysis of Loan Balance to be received as at 2022.12.31					No of Employees	Recover as at 2024.05.31	No of Employees	Loan Balance to be received as at 2024.05.31	
			Month 0-03 (Rs.)	Month 03-12 (RS.)	Year 1-3 (Rs.)	Year 3-5 (Rs.)	Year 5-10 (Rs.)				Year 3-5 (Rs.)	Over 5 Year (Rs.)
From the officers transferred to other Ministries/Department	1	154,730.00	154,730.00					1	154,730.00			
From the officers transferred to Provincial Councils	4	382,800.00	196,100.00	10,000.00	95,000.00		81,700.00	1	89,200.00	3	245,900.00	47,700.00
From the Deceased officer	19	2,266,323.63	249,558.00	504,730.00	955,738.00	259,383.13	296,919.50	9	1,090,656.11	10	1,030,265.00	145,402.52
From the Retired officer	92	9,412,407.87	3,859,940.00	458,072.00	2,157,517.24	2,107,629.00	799,249.63	53	5,321,706.87	39	3,142,896.00	947,805.00
From the officers on Interdiction	5	352,919.61	167,435.00		113,198.00	26,000.00	46,286.61	1	237,696.00	4	68,437.00	46,786.61
From the officers who Vacated their Post	22	2,590,213.00	202,325.00	906,798.00	1,045,873.00	389,329.00	45,888.00	7	1,437,950.64	13	1,038,194.36	114,068.00
From the officers who Suspended from their Post	12	750,518.58	129,811.00		39,344.50	65,496.34	515,966.74	4	374,399.00	8	26,844.50	349,375.08
From the officers gone aboard on no pay	1	194,433.00	194,433.00					1	50,099.91	1	144,333.09	[illegible]
Total	154	16,104,445.69	5,184,327.00	1,879,600.00	4,406,670.74	2,846,837.47	1,787,010.48	77	8,756,438.53	77	5,696,869.95	1,651,137.21

Prepared by- Signature .... Name KWS Sisara .... Designation DO ....

Checked by- Signature .... Name P.K.A.Dharmas... .... Designation MSO ....

Approved by - Signature .... Name Amila Ten... .... Designation Accountant ....

ඇමුණුම 02

පොදු තැන්පත් ගිණුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට කාලය වර්ෂ 02 හා 05 ඉක්ම වූ තැන්පතු ශේෂය රු 93,526,824.32 ක් විය.

එම තැන්පතු ශේෂය තුළ වූ කාලය වර්ෂ 02 ත් 05 ත් අතර තැන්පතු ශේෂය වන රු 87,209,875.00 අතරින් රු 53,913,373.53 ක මුදලක් 2024.06.30 දිනට නිරවුල් කර ඇත. තවද ඉතිරි ශේෂය රු. 33,296,502.41 ක් වේ. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-18-0-10-0-0 ගිණුමේ වූ රු 413,789.45 ක මුදල රජයේ නිලධාරීන් වෙත නිල නිවාස ලබා දීමේදී අය කරනු ලබන තැන්පතු මුදල් වේ. මෙම මුදල අදාළ නිලධාරියා විසින් නිල නිවාස භාර දුන් පසු නිදහස් කරනු ලබයි. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-16-0-8-0-0 ගිණුමේ වූ රු 26,986,300.04 ක මුදල ව්‍යාපෘති වලට අදාළ රැදවුම් මුදල වන අතර එම මුදල ව්‍යාපෘති අවසන් වූ පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-13-0-36-0-0 ගිණුමේ වූ රු 1,925,362.92 ක මුදල ව්‍යාපෘති වලට අදාළ වන අතර එම ව්‍යාපෘති වැඩ තවමත් අවසන් වී නොමැත. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-2-0-189-0-0 ගිණුමේ වූ රු 3,971,050.00 මුදල උමාඔය ව්‍යාපෘතියට අදාළ ටෙන්ඩර් තැන්පතු වන අතර එය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

එමෙන්ම කාලය වර්ෂ 5 ඉක්ම වූ තැන්පතු ශේෂය වන රු. 6,316,948.36 අතරින් රු 1,597,929.96 ක මුදලක් 2024.06.30 දිනට නිරවුල් කර ඇත. ඉතිරි ශේෂය වන රු 4,719,018.42 ක් වේ. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-18-0-10-0-0 ගිණුමේ වූ රු 878,909.40 ක මුදල රජයේ නිලධාරීන් වෙත නිල නිවාස ලබා දීමේදී අය කරනු ලබන තැන්පතු මුදල් වේ. මෙම මුදල අදාළ නිලධාරියා විසින් නිල නිවාස භාර දුන් පසු නිදහස් කරනු ලබයි. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-16-0-8-0-0 ගිණුමේ වූ රු 840,109.02 ක මුදල ව්‍යාපෘති වලට අදාළ රැදවුම් මුදල වන අතර එම මුදල ව්‍යාපෘති අවසන් වූ පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. ඉතිරි ශේෂයන් තුළ 6000-0-0-13-0-36-0-0 ගිණුමේ වූ රු 3,000,000.00 ක මුදල මෙම මුදල හකිරිල්ල වැව ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාල වූවකි. එම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මෙවනවිටත් ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකරන බැවින් එම මුදල තවදුරටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගන්නා ඇත.

ndex.php?option=com_contact&view=contact&id=1&Itemid=111&lang=si

Gov.lk

තමිළ් English සිංහල

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකාව

මුල් පිටුව අපි ගැන [illegible] ප්‍රධාන කාර්යාලය [illegible] ගැලරිය විමසීම

[illegible]

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තැපැල් පෙට්ටිය 1138, 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
+94 11 2581 182
+94 11 2506590

* Required field

නම *

විද්‍යුත් තැපෑල *

මාතෘකාව *

පණිවිඩය *

Spam check: 1 plus 1 equals

විද්‍යුත් තැපෑල යොමුකරන්න

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අගෝස්තු 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 නොවැම්බර් 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.